# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் அமைச்சு
# MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/PMD/03/21
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2011.12.26

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ : 454**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**රජයට අයත් වාහනවල යෝග්‍යතා පරීක්ෂාව හා නඩත්තු කිරීම (වායු විමෝචන පරීක්ෂාව)**

රජයට අයත් මෝටර් කාර්, ලොරි, බස්, වෑන්, මෝටර් සයිකල් ආදී සියළුම වර්ගවල වාහන 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතේ නියමයන් යටතේ 2003 ජුනි මස 30 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූලව නඩත්තු කළ යුතුය.

02. ඒ අනුව වාර්ෂිකව ඔබ ආයතනයට අයත් සියළුම වාහන ඉහත සඳහන් ගැසට් නිවේදනයේ සඳහන් නියමයන්ට සහ ප්‍රමිතීන්ට අනුකූලව වායු විමෝචන පරීක්ෂණ ආයතනයක් වෙතින් පරීක්ෂා කර සහතිකයක් ලබා ගත යුතුය. මෙම කාර්යය පහසුවෙන් හා ක්‍රමවත්ව ඉටු කර ගැනීම පිණිස දැනට ලියාපදිංචි කර ඇති පහත සඳහන් ආයතන මගින් විමසා කටයුතු සංවිධානය කර ගත හැකිය.

i) අධ්‍යක්ෂ, ලාෆ්ස් එකෝ ෆ්‍රී (පුද්) සමාගම, අංක 14, ආර්.ඒ. ද මැල් මාවත, කොළඹ 04.
දුරකතන අංකය : 0117770770

ii) අධ්‍යක්ෂ, ක්ලීන්කෝ ලංකා (පුද්) සමාගම, අංක 334, ටී.බී. ජයා මාවත, කොළඹ 10.
දුරකතන අංකය : 0114880000

03. නියමිත ප්‍රමිතීන්ට අනුව මෙම පරීක්ෂණ කර ගැනීමෙන් වාහන (එන්ජින්) නිසි පරිදි නඩත්තු කළ හැකි වේ. එමගින් එන්ජින් නඩත්තුව සඳහා දරණ පිරිවැය අවම කර ගැනීමට හා කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවනු ඇත. පරිසරයට එකතු වන විෂ වායු ප්‍රමාණය අවම කර යහපත් පරිසරයක් පවත්වාගෙන යෑමේ සමාජ වගකීම ඉටු කිරීමට ද මෙම ක්‍රියාවලිය හේතු වන බැවින්, ඉහත වැඩ සටහන සාර්ථක කර ගැනීමට පියවර ගන්නා ලෙස මෙයින් දැනුම් දෙමි.

පී.ඒ. අබේසේකර
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

පිටපත
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

- දැන ගැනීම සහ සුදුසු කටයුතු සඳහා